**ශීර්ෂය 5 - අමාත්‍ය මණ්ඩල කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 5 - අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 මැයි 16 දින අමාත්‍ය මණ්ඩල ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙළ කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

-------

## 2.1 විසර්ජන ගිණුම

-----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

-----------------------------

අමාත්‍ය මණ්ඩල කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 77.40 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 65.56 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 11.84 ක් හෙවත් සියයට 15 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 67.55 | 62.90 | 4.65 | 7 |
| මූලධන | 9.85 | 2.66 | 7.19 | 73 |
| එකතුව | 77.40 | 65.56 | 11.84 | 15 |

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍ය මණ්ඩල කාර්යාලයට අදාල විෂය අංක 00501 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 2.59 | 2.50 | 2.39 | 2.96 | 13.00 | 9.05 |

## 2.3 අග්‍රිම ගිණුම

අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 0.21 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.184,000 ක් විය. විස්තර පහත දැක්වේ.

| කාර්යාලය | තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| අමාත්‍ය මණ්ඩල කාර්යාලය | 6000/0000/00/0016/0029 | 180,000 |
| -එම- | 6000/0000/00/0018/0036 | 4,000 |
| **එකතුව** | | **184,000** |

## 2.5 විගණන නිරීක්ෂණය

අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙළ කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 3.1 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.1.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2016 මැයි 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 3.2 වත්කම් කළමනාකරණය

කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2016 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, කාර්යාලය විසින් එම වාර්තා 2016 මැයි 31 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2014 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

**3.3 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

**ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 6 ක් වූ ලේඛන සංරක්ෂණය හා කළමනාකරණ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය 2012 වර්ෂයේදී ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණි. ව්‍යාපෘතියේ විෂය පථය සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් අදහස් හුවමාරු කර ගැනීමටත්, ඉදිරියේදී ඇතිවන තාක්ෂණික වෙනස්කම්වලටද අනුකූල වන පරිදි සැලසුම් කළ යුතු වීම නිසා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද කර තිබුණි.

**3.4 කාර්යසාධනය**

කාර්යාලය විසින් 2015 අගෝස්තු 31 දිනට ඉදිරිපත් කර තිබුණු තොරතුරු අනුව එදිනට කාර්යාලය වෙත ඉදිරිපත් වී ඇති අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව 1243 ක් වී තිබුණි. එයින් සංදේශ 94 ක් අමාත්‍ය මණ්ඩලය වෙත හෝ ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව වෙත හෝ ඉදිරිපත් කර නොතිබුණි. ඉතිරි සංදේශ 1149 සංදේශ 1045 ක් සඳහා අවසන් තීරණ ගෙන තිබුණි. අමාත්‍ය මණ්ඩලය වෙත හෝ ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව වෙත ඉදිරිපත් කර ඇති නමුත් අවසන් තීරණයක් ගෙන නොතිබූ සංදේශ සංඛ්‍යාව 104 ක් විය. 2015 දෙසැම්බර් 31 දින දක්වා අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්යසාධනය, විගණනය වෙත ඉදිරිපත් කරන ලෙස 2016 මැයි 13 දිනැති ලිපියෙන් ඉල්ලා තිබුණත්, 2016 මැයි 31 දින වන විටත් එම කාර්යසාධනය පිළිබඳ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**3.5 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 16 | 11 | 05 |
| (ii) | තෘතියික මට්ටම | 10 | 10 | - |
| (iii) | ද්විතියික මට්ටම | 32 | 25 | 07 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 32 | 25 | 07 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | - | - |
| | **එකතුව** | **90** | **71** | **19** |